**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 01 ව්‍යාපෘතිය - 2017**

---

මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 01 ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 ජුනි 28 දින එළඹි ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.10 වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 ජුනි 28 දින එළඹි අංක 2947 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය හා අංක 2948 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණු වනුයේ, නාගරික පරිසරය වැඩිදියුණු කිරීම හා මහ කොළඹ ප්‍රදේශයේ නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම වේ. වැඩසටහන අපේක්ෂා කරනු ලබන්නේ (අ) කොළඹ නගරයේ ජල සම්පාදන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ ව්‍යාප්ත කිරීම සහ ආදායම් නොලබන ජලය අඩු කිරීම (ආ) මහ කොළඹ ප්‍රදේශයේ අප ජලය සේවා වැඩිදියුණු කිරීම (ඇ) ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සහ සේවා සපයන්නන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම සහ (ඈ) ආයෝජන වැඩසටහන කළමනාකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීමවේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,784 කට සමාන එජඩො මිලියන 112 ක් වන අතර ඉන් රු.මිලියන 11,088 කට සමාන එජඩො මිලියන 84 ක් හෙවත් සියයට 75 මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,696 කට සමාන එජඩො මිලියන 28 ක් හෙවත් සියයට 25 ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කරයි. වැඩසටහන එහි කටයුතු 2013 සැප්තැම්බර් 25 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව, වැඩ සටහනේ කාල පරිච්ඡේදය 2019 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ

විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම වැඩසටහන විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහනේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌන පූරණයන් වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌන පූරණයන් වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දක්වා ගෙවන ලද එකතුව රු.මිලියන 16.34 ක එකතු කළ අගය මත බද්ද කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකත්වයට එරෙහිව හිලව් කර තිබුණි.

(ආ) වෙනත් ව්‍යාපෘතියක් මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ තලාවල පුහුණු මධ්‍යස්ථානයේ නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සඳහා පස පිළිබඳ පරීක්ෂණය වෙනුවෙන්

වැඩසටහන මඟින් වැයකර තිබුණු එකතුව රු.මිලියන 1.2 ක් මෙම වැඩ සටහනේ කෙරීගෙන යන වැඩ යටතේ වැරදි ලෙස දක්වා තිබුණි.

(ඇ) ආසියානු සංවර්ධන බැංකුවේ වියදම් කිරීම් පිළිබඳ අත් පොතෙහි 4.12 වගන්තියට අනුව, ඉදිකිරීම් කාලපරිච්ඡේදය තුළදී දරන ලද පොළිය සහ බැදීම් ගාස්තු ප්‍රාග්ධනිත කිරීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, 2017 දෙසැම්බර් 31 දක්වා වැඩසටහන මඟින් ගෙවන ලද රු.මිලියන 166.37 ක පොළිය සහ බැදීම් ගාස්තු ඉදිකිරීම් පිරිවැයක් ලෙස දක්වා නොතිබුණි.

**2.2.2 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 06(1)(අ) වගන්තිය අනුව, රු.මිලියන 5 ක් හෝ ඊට වැඩි කොන්ත්‍රාත් භාරගන්නා කොන්ත්‍රාත්කරුවන් විසින් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතු අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු දින 60 ක් ඇතුළත කොන්ත්‍රාත් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේවෙතත්, වැඩසටහන සමඟ කටයුතු කරන කොන්ත්‍රාත්කරුවන් ඉහත අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරනලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 84 | 11,088 | 1,567 | 11.94 | 1,856 | 39.65 | 5,676 |
| ශ්‍රී ලං ර | 28 | 3,696 | 213 | 1.27 | 198 | 12.62 | 1,801 |
| **එකතුව** | **112** | **14,784** | **1,780** | **13.21** | **2,054** | **52.27** | **7,477** |

ඉහත සඳහන් තොරතුරු අනුව, ණය නියෝජිතායතනය විසින් සපයන ලද රු.මිලියන 11,088 කට සමාන එ.ජ.ඩො. මිලියන 84 ක මුළු වෙන්කිරීමෙන් වැඩසටහනේ කටයුතු ආරම්භ කර වසර 4 ½ ක් ඉකුත්වීමෙන් පසු 2017 දෙසැම්බර් 31 දිනට සියයට 47.2 ක් නියෝජනය වන එකතුව රු.මිලියන 5,676 කට සමාන එ.ජ.ඩො. මිලියන 39.65 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එමනිසා වැඩසටහනේ ඉතිරි කාලපරිච්ඡේදය තුළදී ඉතිරි ප්‍රතිපාදිත මුදල් උපයෝජනය කිරීමේ හැකියාව විගණනයේදී බැහැරකළ නොහැකි විය.

## 3.2 භෞතික ප්‍රගතිය

වැඩසටහනේ ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 37.41 සහ සියයට 47.39 මට්ටමක පැවතුණි. 2017 දෙසැම්බර් 31 දිනට කොළඹ නගරයේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා පද්ධති පුනරුත්ථාපනය කිරීමේ ප්‍රධාන කොන්ත්‍රාත්තු යටතේ කාර්යයන්වල පිළිවෙලින් සියයට 45 සහ සියයට 27 අඩු ප්‍රගතියක් දක්වා තිබුණි. මිලදී ගැනීමේ ක්‍රියාවලිය අනුගමනය කිරීමේ ප්‍රමාදයන්, නල එලීමේ කටයුතු සඳහා කානු රහිත ක්‍රමයේ සිට විවෘත කානු ක්‍රමයට මාරුවීම සහ කොන්ත්‍රාත්කරුවන්ගේ අඩු කාර්ය සාධනය යනාදිය වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ අඩු ප්‍රගතිය සඳහා බලපා තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ නගරයේ බස්නාහිර ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය පිළිබඳ උපදේශන සේවා සැපයීම, මහජනතාව දැනුවත් කිරීම් සහ මාධ්‍ය ව්‍යාපාර පැවැත්වීම යනාදි සංරචක කිහිපයක් යටතේ වැඩසටහන මඟින් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල නිම කිරීමේ දින පිළිවෙලින් 2021 පෙබරවාරි 21 සහ 2020 ඔක්තෝබර් 31 ලෙස වැඩසටහනේ කටයුතු නිම කිරීමේ දිනය වන 2019 ජුනි 30 දිනට පසු දිනයන් තීරණය කර තිබුණි.

(ආ) කොළඹ නගරයේ උතුරු ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය සඳහා පද්ධතිය පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව යටතේ කටයුතු 2015 ජනවාරි ආරම්භ කර තිබුණි. එමනිසා කලාප මැනුම් ප්‍රදේශ 16 ක මීටර් 142,269 සහ නිවාස 40,460 ක සැපයීම්වල නල එලීම් සහ පීඩන පරීක්ෂාවන් නිම කිරීමට බලාපොරොත්තු විය. කෙසේවෙතත්, කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය වර්ෂ 3 ½ කින් 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ½ ක් ඉකුත් වී ඇතත් කලාප මැනුම් ප්‍රදේශ 03 නල එලීමේ කටයුතු පමණක් අවසන් කර තිබුණි. තවද, අනෙකුත් කලාප මැනුම් ප්‍රදේශ 03 ක මීටර් 14,100 නල එළීමේ කටයුතු 2017 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2017 දෙසැම්බර් 31 දිනට නිවාස 5,981 ක සැපයීම් කටයුතු පමණක් අවසන් කර තිබුණි.

(ඇ) කොළඹ නගරයේ නැගෙනහිර ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව යටතේ කටයුතු 2015 ජූලි ආරම්භ කර 2019 ජූලි වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට අඩු ප්‍රගතියක් පෙන්වා තිබුණි. එමනිසා, කලාප මැනුම් ප්‍රදේශ 20 ක මීටර් 137,209 ක නල එලීම් සහ පීඩන පරීක්ෂා කිරීමේ කටයුතු නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය වර්ෂ 4 කින් 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ½ ක් ඉකුත් වී ඇතත් කලාප මැනුම් ප්‍රදේශ 10 ක මීටර් 58,106 ක නල එලීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, එදිනට නිවාස 1,039 සැපයීම් කටයුතු පමණක් නිමකර තිබුණි.

(ඈ) කොළඹ නගරයේ උතුරු ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය සඳහා පද්ධතිය පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුවේ ලංසු ලියවිලි අනුව, නල එලීම සඳහා නල බැදීම සහ නල පිපිරීම් ක්‍රමය යොදා ගැනීමට යෝජනා කරන ලදි. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරු විසින් යෝජනා කළ පරිදි, නල එලීම සඳහා විවෘත කාණු ක්‍රමය යොදාගැනීමට ඉඩදී තිබුණි. කෙසේවෙතත්, ලංසු ලියවිලිවල 3.1 සහ 13.2 වගන්ති අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම වෙනුවට ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් පත්කරන ලද කමිටුවක අනුමැතිය පමණක් ඒ සඳහා ලබාගෙන තිබුණි.

(ඉ) නල එළීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර, වැඩසටහනේ කටයුතු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 2016 මැයි ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, එවැනි මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 2016 නොවැම්බර් ආරම්භ කර තිබුණු අතර නල එළීමේ කටයුතුවල විෂය පථයේ පසුව සිදුකරන ලද වෙනස්කම් සැලසීමෙන් තොරව එකතුව රු.මිලියන 2.93 ක් අමතරව ගෙවා තිබුණි.

### 3.4 මතභේදයට තුඩුදෙන ගැටළු

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ නගරයේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ආදායම් නොලබන ජලය සඳහා පද්ධති පුනරුත්ථාපන කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණ පත්‍රවල රු.මිලියන 23 ක සුරක්ෂණ තැන්පතු සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය. එම නිසා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 16.56 ක සුරක්ෂණ තැන්පතු ශ්‍රී ලංකා රජයේ දායකත්වයෙන් වෙනුවට ණය මුදලින් මාර්ග සංවර්ධන අධිකාරියේ තැන්පත් කර තිබුණි.

(ආ) කොළඹ නගරයේ උතුරු ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය සඳහා පද්ධති පුනරුත්ථාපනය සඳහා නල එළීමේ කොන්ත්‍රාත්තුවේ ආරම්භක සැලැස්ම අනුව, නල කාණු ආවරණය සඳහා ගල් කුඩු භාවිතා කිරීමට ඉඩදී තිබුණි. එමනිසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් යොදා ගන්නා ගල් කුඩු කියුබ් එකකට රු.6,800 සාමාන්‍ය රේටය සැලකීමකින් තොරව වැඩසටහන කොන්ත්‍රාත්කරු විසින් මිල කරන ලද කියුබ් එකකට රු.7,755 ක රේටයකට බාහිර පාර්ශවයකින් ගල් කුඩු මිලදී ගෙන තිබුණි.

### 3.5 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සිවිල් වැඩ කොන්ත්‍රාත් 4 කට සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලුම් කරන ලද එකතුව රු.මිලියන 2,274 ක් 2017 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකර පැවතුණු බව නිරීක්ෂණය විය. එමනිසා නොපියවන ලද බිල් මත ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවීමට ඇති හැකියාව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ආ) 2016 ජුනි 10 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 02/2016 චක්‍රලේඛයේ අවශ්‍යතා පරිදි අභ්‍යන්තර විගණකයකු බඳවා ගැනීමට වැඩසටහන පියවර ගෙන නොතිබුණි. තවද, වැඩසටහනේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකයේ විගණනයට යටත්වී නොතිබුණි.

### 3.6 නොවිසඳුනු පෙර විගණන වාර්තාවලින් ඉස්මතු කර දක්වන ලද ගැටළු

--------------------------------------------------------------------------------

රු.මිලියන 24.37 ක ඇස්තමේන්තුගත පිරිවැයකට විදේශීය සමාගමකට 2014 මැයි 29 දින ප්‍රදානය කරන ලද කාන්දු වීම් සොයා ගැනීම සඳහා උපකරණ සපයා සවිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව පසුව අන්‍යෝන්‍ය එකඟතාවයකින් අවසන් කර තිබුණි. කෙසේ වුවද, උපකරණවල දේශීයව නිපදවන ලද කොටස් කිහිපයක් එම සමාගමේ දේශීය නියෝජිතයෙකු විසින් රු.මිලියන 10.62 ක පිරිවැයකට පෙර වර්ෂවලදී සපයා තිබුණි. තවද, උපකරණවල ඉතිරි කොටස් ප්‍රසම්පාදනය කිරීමට 2017 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

## 3.7 පරිබාහිර ගනුදෙනු

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩසටහන් ලියවිලි අනුව, කොළඹ බටහිර ප්‍රදේශයේ ආදායම් නොලබන ජල අංශයට අනුයුක්ත නිලධාරී කණ්ඩායම සඳහා පහසුකම් සැපයීමට මෝටර් වාහනයක් වෙන්කිරීමට බලාපොරොත්තු විය. කෙසේවෙතත්, රු.මිලියන 8.99 පිරිවැයකට මිලදීගත් මෝටර් වාහනයක් වැඩසටහනේ විෂය පථයට අයත් නොවන ප්‍රදේශයක් වන සබරගමු පළාතේ ප්‍රාදේශීය සැපයුම් සේවා මධ්‍යස්ථානයකට වෙන්කර තිබුණි.

(ආ) වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කිරීමට එම නිලධාරින් වගකීමක් නොමැති වුවද, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 2.12 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.